0_ 044

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2009

ESP 2312 - අධ්‍යාපනයේ දාර්ශනික සහ සමාජ විද්‍යාත්මක පදනම

කාලය - පැය තුනයි.

---

දිනය - 2009 පෙබරවාරි 08 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයක් සඳහාම වෙනම පොතක පිළිතුරු ලියන්න.

01. i. අධ්‍යාපනය හා වැඩලෝකය සම්බන්ධ කළ හැකි ක්‍රියාකාරිත්වයන් තුනක් (03) සඳහන් කරන්න.
(ලකුණු 08)

ii. 2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යාපනය හා වැඩ ලෝකය සම්බන්ධ කිරීමට හඳුන්වා දී ඇති නව්කරණ ප්‍රයත්නයන් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 10)

iii. අධ්‍යාපනය හා වැඩ ලෝකය සම්බන්ධ කිරීමට ගෙන ඇති ඉහත නව්කරණයන්ගෙන් තුනක් (03) තෝරාගෙන, ඒවා ක්‍රියාවට නැංවීමේදී මතුවිය හැකි ගැටළු මඟහරවා ගැනීමට හෝ අවම කිරීමට ගත හැකි මාර්ග විවේචනාත්මකව පරීක්ෂා කරන්න.
(ලකුණු 15)

02. i. ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන ගැටළු/මතවාද තෝරාගත් වෙනත් රටවල් දෙකක් සමග සංසන්දනය කරන්න.
(ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම්කරණයේ දී ඉහතින් දක්වන ලද ගැටළු කෙරෙහි අවධානය යොමුකර ඇත්දැයි ඔබ සිතන්නේ ද? ඔබේ පිළිතුරට හේතු සපයන්න.
(ලකුණු 10)

iii. ඉහතින් සඳහන් කරන ලද ගැටළු විසඳීම සඳහා භාවිත කළහැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.
(ලකුණු 15)

03. i. "බහු සංස්කෘතික අධ්‍යාපනය" ඔබ නිර්වචනය කරන්නේ කෙසේ ද?
(ලකුණු 08)

ii. බහු සංස්කෘතික අධ්‍යාපනයේදී මතුවිය හැකි ප්‍රතිජනනාත්මක ප්‍රතිඵල හා සංජානිත දුෂ්කරතා ලැයිස්තුගත කරන්න.
(ලකුණු 10)

iii. ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික අධ්‍යාපනය දියුණු කිරීමට ගෙන ඇති අධ්‍යාපනික ක්‍රියාමාර්ග පරීක්ෂා කරන්න.
(ලකුණු 08)

04. i. "ඕනෑම සමාජයක අධ්‍යාපනය එහි සංස්කෘතිය පිළිබිඹු කරයි." ඉහත ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 08)

ii. "වර්තමාන ශ්‍රී ලාංකික සමාජයේ සදාචාර හා සාරධර්ම පිරිහීමට ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වගකිව යුතුය." ඉහත ප්‍රකාශය පරීක්‍ෂා කර ඔබ එම ප්‍රකාශයට එකඟ වන්නේ ද නැද්ද යන්න විස්තර කරන්න. (ලකුණු 10)

iii. ශිෂ්‍යයන්ගේ සදාචාර අගයයන් සංවර්ධනය කිරීමේදී ගුරුවරයාගේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 15)

05. i. පරම්පරා අතර සචලතාවය හා පරම්පරා ඇතුළත සචලතාවය අතර වෙනස දක්වන්න. (ලකුණු 08)

ii. පහළ සමාජ පන්තිවලට අයත් සිසුන්ට විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට බාධාකරවන පාසල් ක්‍රියාවලිය හඳුනාගෙන විස්තර කරන්න. (ලකුණු 10)

iii. "වර්තමාන අධ්‍යාපන පද්ධතිය පුද්ගලයන්ගේ සමාජ සචලතාවයට හේතුවේ." ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න. (ලකුණු 15)

06. i. "මානව සංවර්ධනය" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධනය දියුණු කිරීම සඳහා දායක වී ඇති ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 10)

iii. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන මට්ටම වළක්වන සාධක තුනක් (03) හඳුනාගෙන සාධක අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 15)

- හිමිකම් ඇවිරිණි. -